# අම්පාර රජගල පුරවිද්‍යා පරිශ්‍රයේ දානශාලාව පිළිබඳ පුරවිද්‍යාත්මක අධ්‍යයනයක්

ඩී.ජ්.එම්.පී. ගුණවර්ධන

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
pereramaduwanthi615@gmail.com

**මුඛ්‍ය පද** - රජගල, දානශාලාව, ඕවලාකාර හැඩ, සහිත බැමි.

**හැඳින්වීම**

රජගල යනු මිහින්තලේ, රිටිගල, අරන්කැලේ, කුඩුම්බිගල ආදී වනගත භික්ෂු වාසස්ථාන මෙන් අනුරාධපුර යුගයේ දී ප්‍රසිද්ධියක් ලැබූ භික්ෂු ආරාමයකි. නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ මහඔයේ මාර්ගයේ කිලෝමීටර් 26 ක් පමණ ගමන් කිරීමේ දී හමුවන බක්කිඇල්ල හන්දියට නුදුරින් විශාල කඳුගැටයක රජගල ආරාමික පුරාවිද්‍යා භූමිය පිහිටයි. ඒ මුහුදු මට්ටමේ සිට අඩි 1038ක් පමණ උසිනි. මෙහි දැනට හඳුනාගෙන ඇති වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම් අතරින් නිර්මාණශීලී අංගයක් ලෙස දානශාලා ගොඩනැගිල්ල පෙන්වාදිය හැක. රජගල කඳු මුදුනේ පිහිටි මිහිඳු දාගැබට උතුරින් හා වැවට ආසන්න නැගෙනහිර දිශානුගතව මෙම ගොඩනැගිලි විශේෂය ස්ථානගතව ඇත. මෙහි දී දානශාලාව අවධි දෙකක් තුළදී සංවර්ධනය වී ඇති අතර වාස්තුවිද්‍යාත්මක වශයෙන් භාවිත ශිල්ප ක්‍රම, ආකෘතිය හා භාවිත අමුද්‍රව්‍ය හැඩගැස්වීම් පෙර අවධියට වඩා පසු අවධිය තුළ දී වෙනස්කමකට භාජනය වී ඇත් ද? යන්න මෙම පර්යේෂණයේ ගැටළුව බවට පත් වේ. අධ්‍යයනයේ දී මූලික වශයෙන්ම දානශාලා ගොඩනැගිල්ලේ ආකෘතිය, ඉදිකිරීම් ශිල්පය, භාවිතා අමුද්‍රව්‍ය හා තාක්ෂණික ක්‍රම ශිල්ප මෙන්ම කවර භාවිතයක් වෙනුවෙන් නිර්මාණය කළේ ද යන්න සොයා බැලීම මෙම පර්යේෂණයේ මූලික අරමුණයි.

**ක්‍රමවේදය**

මෙහිදී ශ්‍රී ලංකාවේ පැරණි බෞද්ධ සංඝාරාම පිළිබඳව සාහිත්‍ය මූලාශ්‍රගත තොරතුරු එක්රැස් කිරීමක් සිදුකරන ලදී. අධ්‍යයන ක්ෂේත්‍රය පිළිබඳව පූර්ව පර්යේෂකයන් විසින් අනාවරණය කරගෙන ඇති දත්ත විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව ක්ෂේත්‍ර ගවේෂණය යටතේ තොරතුරු ලබා ගන්නා ලදී. එහි දී අවශ්‍ය පරිදි ඡායාරූප ලබාගනිමින් සහ සැලසුම් අඳිමින් මෙම පර්යේෂණයට අදාළ තොරතුරු රැස් කරන ලදී.

**ප්‍රතිඵල හා සාකච්චාව**

ශ්‍රී ලංකාවේ බෞද්ධ ආරාමික ඉදිකිරීම් අතර දානශාලාවට විශේෂ තැනක් හිමිව තිබූ බව පුරාවිද්‍යාත්මක හා සාහිත්‍යය මූලාශ්‍ර අධ්‍යයනයේ දී පැහැදිලි වෙයි. අනුරාධපුර ඇතුළු නුවර මහා විහාරයේ රුවන්වැලිසෑය ඉදිරිපිට, මිහින්තලය, අභයගිරි ආදී ස්ථානවල වඩා ප්‍රසිද්ධ දානශාලා හමුව තිබේ. ශ්‍රී ලංකාවෙන් මෙවැනි ඕවලාකාර හැඩයේ දාන ශාලාවක ආකෘතියක් වාර්තා වී නොමැති අතර ගොඩනැගිල්ලේ පැහැදිලි ලෙස ඉදිකිරීම් අවධි දෙකක් හඳුනාගත හැකිය. ගොඩනැගිල්ලට පිවිසීමට හා පිටවීමට දොරටු දෙකක් ඇත. ඒවා නැගෙනහිරට මුහුණලා එම බිත්තියේ පමණක් සකස් කොට තිබේ. එම කොටස මුලින් සකස් කොට තිබී ඇති අතර පසුව දොරටු සහිත එම මුහුණත එසේ ම භාවිතයට තිබිය දී ගොඩනැගිල්ල දෙපසින් ඕවලාකාර හැටියට බිත්ති බඳිමින් බටහිර දෙසින් වැඩි ඉඩ අවකාශයක් ලබා ගනිමින් ගොඩනැගිල්ල ඉදි කොට ඇත. මෙම ඉදිකිරීමේ අවධි දෙක පිළිබඳව යම් අදහසක් ලබා ගැනීමට උපකාර වන ශිලා ලේඛන සාධකයක් මෙම ගොඩනැගිල්ල කැණීම් කරන අවස්ථාවේ දී හමුවී ඇත. එනම් මෙහි වම් ප්‍රවේශ දොරටුවේ උළුවස්ස සවිවන යටෙළිපතෙහි වම් පස ක්‍රි.ව. 2 සියවසට අයත් වන අක්ෂර කිහිපයකින් යුතු ලිපියකි. එහි "අයහ" යනුවෙන් සටහන් කොට ඇති අතර එමගින් පැහැදිලි වන්නේ එම උලුවස්ස "අය" නැමැත්තාගේ නිර්මාණයක් බවයි. ඒ අනුව මෙහි මුල් ඉදිකිරීම ක්‍රි.ව. 2 සියවසේ දී සිදුවන්නට ඇති බවත් ප්‍රතිසංස්කරණය ක්‍රි.ව. 8 - 9 සියවස්වල සිදු වන්නට ඇති බවත් උපකල්පනය කල හැකි ය.

දානශාලාවේ මුල් ඉදිකිරීමට අයත් ගොඩනැගිල්ලේ පාදම සකසා ඇත්තේ බොරදම් තීරු සහිත අලංකාර ගල් උපයෝගී කර ගනිමිනි. එම කොටසෙහි බිත්ති බැඳීම සිදු කොට ඇත්තේ ගඩොල් භාවිත කරමිනි. එම පැරණි ගොඩනැගිල්ල තුළ උතුරු හා දකුණු කෙළවර දෙපසින් කුඩා කාමර දෙකක් හඳුනාගත හැකි වන අතර එහි උතුරු පස කාමරය තුළ සඳකඩපහණක් දක්නට ලැබේ. ඒ හා බද්ධව උතුරු දෙසට තිබූ දොරටුවක් පසුකාලයේ දී කළ පිරිසකර කිරීමකදී වසා දැමූ බවට සාධක තිබේ. දෙවැනි ඉදිකිරීමේදී මෙම ගොඩනැගිල්ලේ පාදම හා ඊට බද්ධ බැමි සංරක්ෂණය කිරීමේ දී එකම ක්‍රමයක් එම ඉදිකිරීම් සඳහා යොදා නොගත් බව පැහැදිලි වේ. එහිදී විශාල ගල් පුවරු විවිධ හැඩයේ ලොකු, කුඩා ගල් කුට්ටි ද, අතරින් පතර ගඩොල් ද භාවිත කරමින් ඉදිකර ඇති බවට සාධක හඳුනා ගත හැකි ය. ගොඩනැගිල්ල සඳහා නැගෙනහිර දිශාවෙන් පියගැටපෙළ දෙකක් වන අතර මේවා කොරවක්ගල්, මුරගල්, සඳකඩපහණවලින් සමන්විත ය. මෙම සඳකඩපහණ දිගැටි රවුම් හැඩයෙන් යුක්ත වේ. මේවායෙහි කිසිදු කැටයමක් නොමැත. මුරගල් අතුරින් දැනට ශේෂව ඇති දකුණු දොරටුවේ මුරගල් කොටු සහිත ජ්‍යාමිතික රටාවක් කැටයම් කර තිබූ බවට සාධක ඇත.

මහා සාලාවේ හරි මැදින් දික් අතට කළු ගලින් 26m සහ 50cm කින් යුතුව කොට බැම්මක් බැඳ ඇති අතර මෙහි පළල 35cm ක් පමණ වේ. භික්ෂූන් වහන්සේලාට වාඩි වීම පිණිස කරන ලද්දක් යැයි සිතේ. දළ වශයෙන් භික්ෂූන් හැටකට පමණ මෙහි වාඩි වීමට හැකි බව පෙනේ. ඇතුළත ගෙබිම සම්පූර්ණ චතුරස්‍රාකාර හැඩයෙන් යුතු ගඩොල් ඇතුරුමක් මගින් ආවරණය කර තිබේ. මේවා අතර ආයත චතුරස්‍රාකාර ගඩොල් ද දක්නට ලැබේ. මෙම ගොඩනැගිල්ලේ දැකිය හැකි සුවිශේෂී වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම් ලෙස ගල්කණු පෙන්වාදිය හැකි ය. විවිධ ප්‍රමාණයන්ගෙන් ගල්කණු විශාල ප්‍රමාණයක් මෙහි ඇති අතර සියළුම ගල්කණු සම්පූර්ණ වී නම් මෙහි ගල්කණු 124ක් පමණ ආකෘතියට අනුව තිබිය යුතුය. සංරක්ෂණයෙන් පසු සම්පූර්ණ ගොඩනැගිල්ලේ ගල්කණු 120 සිටුවා ඇති අතර කණු හතරක අඩුවක් ඇත. මෙම ගල් කණු අතරින් ගොඩනැගිල්ලේ බටහිර දිසාවේ පිහිටි කණු පෙළේ කණු කිහිපයක පොළොව මට්ටමේ සිට 0.6m ක පමණ උසට හා 0.8m ක් පමණ පළලින් යුතුව සක්ක බැමි ඉදිකර ඇත. මෙලෙස සක්ක බැම්මක් බැඳ ඇත්තේ අතීතයේ දී කැඩී වෙන්වුනු ගල්කණුවල රළු මුල්කොටස සිරස් අතට වල දමා එම කොටස මත ඉතිරි කණුවේ කොටස තබා ඒ වටා මෙම සක්ක බැම්ම ඉදිකර තිබේ. මෙම ගොඩනැගිල්ලේ ඉදිරිපස කොටසේ ගල්කණුවල මුහුණත් සතරම හොඳින් ඔප මට්ටම් කොට සකසා තිබෙන බැවින් එම ගල්කණු බිත්ති තුළ ගිලෙන සේ සකස් නොකළ බව පෙනේ. මෙහි ගල්කණු පිහිටා තිබෙන ආකාරය අධ්‍යයනය කරන විට මෙහි වහලය ද ඕවලාකාර හැඩයට ගැලපෙන සේ අලංකාරව නිර්මාණය කර තිබෙන්නට ඇත. මෙම අධ්‍යයනය තුළින් රජගල ආරාමික පරිශ්‍රයේ දානශාලාව මූලික ලෙස ප්‍රධාන අවධි දෙකක් තුළ නිර්මාණය වූවක් බව තහවුරු කරගැනීම සිදු කරන ලදී. මෙම අවධි දෙක පිරික්සීමේ දී බොහෝවිට එක් ඉදිකිරීමකින් අනෙක් ඉදිකිරීම් අවධියට බොහෝ සෙයින් වෙනස් වී ඇත. ඒ අනුව දානශාලාව විවිධ අනුග්‍රහ සහිතව වර්ධනය වෙමින් විවිධ සංස්කෘතික සංකල්පවලින් පෝෂණය වෙමින් ස්ථාපිත වූ සුවිශේෂී පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත වාස්තුවිද්‍යාත්මක, තාක්ෂණික අගයන් ගැබ් වූ සුවිශේෂ නිර්මාණයක් ලෙස හඳුනාගත හැකි ය.

**ආශ්‍රිත මූලාශ්‍රය**

ගුණවර්ධන, පී. (2010) ***ශ්‍රී ලංකාවේ පැරණි බෞද්ධ සංඝාරාම***, ජා ඇළ: සමන්ති ප්‍රකාශකයෝ.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ඒකාබද්ධ රජගල පුරාවිද්‍යා ව්‍යාපෘතිය, (2018), ***රජගල පුරාවිද්‍යා පර්යේෂණ***, ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.